# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,092 - 2018 ඔක්තෝබර් මස 05 වැනි සිකුරාදා - 2018.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය 2018**

Link Language Examination for Sri Lanka Teacher Educators' Service - 2018

අංක 1925/37 හා 2015 ජූලි මස 28 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරින් සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය 2019 ජනවාරි මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සෑම නිලධාරියකුම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. නිලධාරියකු අ.පො.ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේ නම් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවාගෙන තිබේනම් මෙම සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරින් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1925/37 දරන 2015 ජූලි මස 28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

04. විභාග පටිපාටිය - ලිඛිත පරීක්ෂණය

| විෂය අංකය | විෂය | ලකුණු | කාලය (පැය) |
|---|---|---|---|
| 01 | ඉංග්‍රීසි භාෂාව | 100 | 02 |

05. විෂය නිර්දේශය

5.1 **English Grammar**

A suitable level of proficiency on the following forms of grammar in the spoken and the written language is expected from the candidate.

- Tense and Number
- Sentences (Simple/Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

5.2 **Writing Skills**

The Knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Essay Writing
- Summary writing skills
- Report writing Skills
- Letter writing

5.3 **Reading Skills**

Candidate's ability to Comprehend a printed text, infer meaning and written interpretation is expected.

- Reading and understanding the specific and general meaning of a printed text.
- Reading and Interpretation (Written)

06. විෂයය සාමාර්ථය ලැබීම සඳහා අයදුම්කරුවකු අවම වශයෙන් 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

07. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන ආමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාග අයදුම්කරුවන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

08. මෙහි දැක්වෙන ආකෘතියට අනුව ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට ලදුපත අමුණා තිබේද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතු ය. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

09. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අයදුම්කරුවන් බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති පහත පළ කොට ඇත.

10. ව්‍යාජ තොරතුරු සැපයීම .- අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

11. ඉල්ලුම්පත් 2018.10.26 වැනි දින හෝ ඊට ප්‍රථම, " විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" ලිපිනයට ලැබෙන පරිදි පීඨාධිපති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පමණක් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. මෙම ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයුදම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. එම නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ඇතුළත තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එම පුවත්පත් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර වීමසීම වඩාත් ඵලදායි වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාග යට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. ඉහත 12 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

14. අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. විධිමත් පරිදි තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

15. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. ඒ සඳහා,

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ,
iii. වලංගු රියැදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

16. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250.00 බැගින් අය කරනු ලැබේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ අදායම් ශීර්ෂය 20-03-02-13ට බැරවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡයා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

17. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමාසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

19. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය - 2018**

Link Language Examination for Sri Lanka Teacher Educators' Service - 2018

1. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. (i) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ශ්‍රේණිය :————.
(ii) විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය :————.
(iii) කලාප අධ්‍යාපන කාර්යාලය :————.
(ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා පමණි.)

3. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) රාජකාරි දුරකථන අංකය :————.
(v) ජංගම දුරකථන අංකය :————.

4. (i) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |
(ii) උපන් දිනය :
වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
(iii) ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 | |
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

5. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර :

ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ඔක්තෝබර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

6. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දක්වෙන අයදුම්කරු මගේ විද්‍යාපීඨයේ/ගුරු විද්‍යාලයේ/ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියෙකු බව සහතික කරමි. තව ද අයදුම්කරු විභාග ගාස්තුවෙන් නිදහස් බවද/අයදුම්කරු විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බවද සහතික කරමි.

__________,
පීඨාධිපතිගේ/ගුරු විද්‍යාල විදුහල්පතිගේ/
ගුරු මධ්‍යස්ථාන කලමනාකරුගේ/
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.) (අදාළ නොවන වචන කපා හරින්න.)

10-171

සංශෝධනයයි

**රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2018**

උක්ත තරග විභාගය සම්බන්ධයෙන්අංක 2089 හා 2018.09.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත විභාග නිවේදනයේ ඉංග්‍රීසි විභාග නිවේදනයේ මාතෘකාව පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

Open Competitive Examination for Recruitment to Grade II of Class 2 of Sri Lanka Information and Communication Technology Services - 2018

සටහන :- මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය දීර්ඝ කරනු නොලැබේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

10-687

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2018**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2018.10.31 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| මධ්‍යම පළාත | මාතලේ | ලග්ගල | පළාත් සර්වේයර් ජනරාල් (මධ්‍යම පළාත) පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගන්නෝරුව, පේරාදෙණිය. | ලග්ගල නගරය අවට | 2018.11.30 |

සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2018.10.31 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2018

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2018**

ගොඩනැගිලි අයිතිකරුගේ -

1. සම්පූර්ණ නම : __________.
2. ලිපිනය : __________.
3. දුරකථන අංකය : __________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : __________.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : __________.
2. මාසික කුලී මුදල : __________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : __________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : __________.
5. භූමියේ විශාලත්වය : __________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: __________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : __________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : __________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/.............................) : __________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : __________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

__________.
අයදුම්කරුගේ අත්සන.

10-83

## බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - වලපනේ**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වලපනේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ 2018.10.27 වෙනි දින පෙ.ව. 09.30ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ පූර්ණ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කළින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනුන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ දී මිළදී ගනු ලබන භාණ්ඩ එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගන්නා සෑම අයෙකුම තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

එස්. එල්. එම්. විජේසිංහ,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
වලපනේ.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
වලපනේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | ඒ. ආර්/ 1117/ 17 | කෑන් | 01 |
| 02 | ඒ. ආර්/ 1117/ 17 | දෙකෙළවර රබර් නල යෙදූ තඹ දඟර | 01 |
| 03 | ඒ. ආර්/ 1117/ 17 | වාඩි බැරල් | 01 |
| 04 | 72002/17 පි. ආර්/454/17 | යකඩ මිට සහිත සවල් | 02 |
| 05 | 70487/17 | ප්ලාස්ටික් කෑන් | 01 |
| 06 | 70487/17 | ලා නිල් පාට බූලි | 01 |
| 07 | 72068/17 | ටෝච් (විදුලි පන්දම්) | 01 |
| 08 | 72069/17 | විදුලි පන්දම් | 01 |
| 09 | 72879 | සවල් | 02 |
| 10 | 72916 | මීටර් 05 දිග ටේප් පටි | 01 |
| 11 | 72914 | මීටර් 05 දිග ටේප් පටි | 01 |
| 12 | 72913 | මීටර් කෝදු | 01 |
| 13 | 72917 | මීටර් කෝදු | 01 |
| 14 | 68872(බි/324/15) | පොරව තල | 01 |
| 15 | 70917(බි/396/16) | විදුලි පන්දම් පිහි 01 | 01 |
| 16 | 67788(බි/657/15) | වක්පිහි | 01 |
| 17 | 72915 | මීටර් කෝදු | 01 |
| 18 | 73632 | සවල් | 01 |
| 19 | 73366 | කළු පාට ඉටි කවර | 01 |
| 20 | 73528 | පුනීල | 01 |
| 21 | 73528 | ඇළුමිනියම් කරඬි | 01 |
| 22 | 73523 | පුනීල | 01 |
| 23 | 83527 | පුනීල | 01 |
| 24 | 73527 | ඇළුමිනියම් කරඬි | 01 |
| 25 | 73526 | පුනීල | 01 |
| 26 | 73526 | ඇළුමිනියම් කරඬි | 01 |
| 27 | 73525 | පුනීල | 01 |
| 28 | 73525 | ඇළුමිනියම් කරඬි | 01 |
| 29 | 73524 | ඇළුමිනියම් කරඬි | 01 |
| 30 | 68307 | ටීවී | 01 |
| 31 | 68307 | බෆල් | 01 |
| 32 | 68307 | සී. ඩී. එම්. ඒ. දුරකථන | 01 |
| 33 | 73660 | කොළ පැහැති වීල් බැරෝ | 01 |
| 34 | 73660 | බාල්දි | 01 |
| 35 | 73660 | උදළු | 01 |
| 36 | 53566 (බි/344/13) | යකඩ සවල් | 04 |
| 37 | 53566 (බි/344/13) | තාච්චි | 01 |
| 38 | 53566 (බි/344/13) | ලී මිට සහිත උදළු | 01 |
| 39 | 73710 | තට්ටු තරාදි | 01 |
| 40 | 73710 | වක් පිහිය | 01 |
| 41 | 73617 | නිල් පැහැති ප්ලාස්ටික් කෑන් | 01 |
| 42 | 73618 | නිල් පැහැති ප්ලාස්ටික් කෑන් | 01 |
| 43 | 73619 | නිල් පැහැති ප්ලාස්ටික් කෑන් | 02 |
| 44 | 69276 | ජංගම දුරකථන | 01 |
| 45 | 69765(බි/697/16) | ජංගම දුරකථන | 01 |
| 46 | ඒ. ආර්./474/17 | සි. ජේ. පි. 1687 දරන යතුරු පැදි | 01 |
| 47 | ඒ. ආර්./447/11 | 142-0086 හොන්ඩා වර්ගයේ යතුරු පැදි | 01 |
| 48 | 70067 | උදළු මුල්ලු | 01 |
| 49 | 40851 | සවල් | 01 |
| 50 | 72671 | මයික්‍රොකොරිස් වර්ගයේ දරමිටි | 01 |
| 51 | 72620 | කෝටු (03 වන පන්තියේ) කුඩුදවුල, බෝඹු, අංකෙන්ද, දඹ | 300 |
| 52 | 67390(බි/690/14) | ජංගම දුරකථන | 01 |
| 53 | අංක රහිත | අත්ට්‍රැක්ටර් ටේලර් කොටස | |
| 54 | අංක රහිත | අබලන් තත්ත්වයේ ඇති ඉරුම් පට්ටල් (යකඩ ප්‍රේම්) | 01 |
| 55 | අංක රහිත | විවිධ ප්‍රමාණයේ හිස් බෝතල් | |
| 56 | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් කෑන් | |
| 57 | 70651 | තඹ දඟර | 01 |
| 58 | 57024 | තඹ දඟර | 01 |
| 59 | 70784 | තඹ දඟර | 01 |
| 60 | 70963 | තඹ දඟර | 01 |
| 61 | 71691 | තඹ දඟර | 01 |
| 62 | 58756 | පිහි 01 | |
| 63 | 65847 | පිහි 01 | |
| 64 | ඒ. ආර්./92/09 | පිහි 01 | |
| 65 | 68653 | පිහි 01 | |
| 66 | - | අධිකරණ භූමියේ සුළඟට කඩා වැටී ඇති ගස් වල කොටස් | |

**2017 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත කාර්යාලීය භාවිතයෙන් පසු ඉවත් කරන ලද භාණ්ඩ**

| | | |
|---|---|---|
| 67 | ග්ලාස් පෑඩ් (කැඩී ඇත) 02 | |
| 68 | බංකු (ඇඳි සහිත) (කැඩී ඇත)02 | |
| 69 | පුටු (සාමාන්‍ය) (කැඩී ඇත) 04 | |
| 70 | කී බෝඩ් (ක්‍රියා විරහිත වී ඇත) | 03 |
| 71 | ප්‍රින්ටර් (ක්‍රියා විරහිත වී ඇත)02 | |
| 72 | අල්මාරි (වානේ) අබලන් 01 | |
| 73 | පරිගණක මූසික (ක්‍රියා විරහිත වී ඇත) | 01 |
| 74 | විදුලි පන්දම් (ක්‍රියා විරහිත වී ඇත) | 01 |

10-135

### මහෙස්ත්‍රාත් අධිකරණය - හොරණ

#### නඩු භාණ්ඩ වෙන්දේසිය

හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කර ඇති, මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2018.10.27 වැනි සෙනසුරාදා පෙ. ව. 10.00ට හොරණ මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී විකුණනු ලැබේ.

ඉහත සඳහන් නඩු භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ලබා වෙන්දේසි කිරීමට පැය භාගයකට පෙර ගැණුම්කරුවන්ට පරීක්ෂා කළ හැකිය.

අධිකරණය විසින් නියම කරන ලද ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී, අධිකරණයේ අවසර පරිදි අදාළ භාණ්ඩය වෙන්දේසියේ ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුය.

වෙන්දේසියෙන් මිලට ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරවා ගත යුතු අතර, ගෙවීම මුදල් මගින් පමණක් කළ යුතුය.

මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

මහෙස්ත්‍රාත් - හොරණ.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,

2018 වෙන්දේසිය

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ | තක්සේරු මුදල |
|---|---|---|---|---|
| 1. | 31846 | | ජංගම දුරකථන 1 | |
| 2. | අංක රහිත | (i) | කරාම 4 | |
| | | (ii) | මිට රහිත පොරෝතල 01 | |
| | | (iii) | කෑම පෙට්ටි 01 | |
| 3. | 33394 | (i) | ගැරුම් වට්ටි 01 | |
| | | (ii) | යකඩ කැට කූඩ 01 | |
| 4. | 33395 | | ගැරුම් වට්ටි 01 | |
| 5. | 33396 | | ගැරුම් වට්ටි 01 | |
| 6. | 35221 | (i) | වතුර මෝටර් 01 | |
| | | (ii) | හෝස් 01 | |
| | | (iii) | යකඩ බාල්දි 01 | |
| | | (iv) | බට කූඩ 01 | |
| | | (v) | සවල් 01 | |
| | | (vi) | උදලු 03 | |
| 7. | 35220 | (i) | ප්ලාස්ටික් බාල්දි 01 | |
| | | (ii) | බට කූඩ 01 | |
| | | (iii) | උදලු 01 | |
| | | (iv) | යකඩ බාල්දි 01 | |
| | | (v) | සවල් 01 | |
| 8. | 35968 | | යකඩ සවල් 02 | |
| 9. | 34315 | | යකඩ බාල්දි 04 | |
| 10. | 34288 | | යකඩ බාල්දි 01 | |
| 11. | 34018 | | සවල් 01 | |
| 12. | 33838 | | උදලු 01 | |
| 13. | 33779 | | සවල් 01 | |
| | | | ගැරුම් වට්ටි 01 | |
| 14. | 33344 | | යකඩ බාල්දි 01 | |
| 15. | 32010 | | යකඩ සවල් 02 | |
| 16. | 85673 | | ඉස්කුරුප්පු නියන් 01 | |
| 17. | 28196 | | කළ ගෙඩි 01 | |
| 18. | 30187 | | සුදු පාට බකට් 02 | |
| 19. | 6095 | | අලවංගු 01 | |
| 20. | 22741 | | නිල්පාට රබර් බට 02 | |
| 21. | 68162 | | එල් හැඩැති යකඩ බට 04 | |
| 22. | 34591 | | හෙයාර් ඩ්‍රයි මැෂින් 01 | |
| 23. | 89636 | | ආරක්ෂිත හිස් වැසුම | |
| 24. | 68828 | | විවිධ හැඩැති යකඩ කොටස් | |
| 25. | 60111 | (i) | යකඩ කම්බි කූරු 60ක් පමණ | |
| | | (ii) | වානේ කම්බි රෝල් 05 | |
| 26. | 88227 | | ඔට්ටපාලු උර 01 | |
| 27. | 3790/15 | | උදලු 01 | |
| 28. | 77134 | | ජංගම දුරකථන | |
| 29. | 95483 | | ගල් ඉනි 01 | |
| 30. | 74174 | | ජංගම දුරකථන 01 | |
| 31. | 11600 | | ගල් ඉනි 01 | |
| 32. | 70335 | (i) | විල් බැරෝ 01 | |
| | | (ii) | ඇදුම් උදලු 01 | |
| | | (iii) | උදලු 02 | |
| | | (iv) | යකඩ සවල් 04 | |
| 33. | 66104 | | යකඩ පලංචි ජැක් 03 | |
| 34. | 63872 | | රබර් ෂීට් අඩංගු පොහොර උරය | |
| 35. | 19305 | (i) | ජංගම දුරකථන 01 | |
| | | (ii) | විදුලි පන්දම | |
| 36. | 20200 | | යකඩ සවල් 01යකඩ කූරු 01 | |
| 37. | 94350 | | කූඩ 01 | |
| 38. | 10954 | | ජංගම දුරකථන 01 | |
| 39. | 95066 | | කටවුඩ් 01 | |
| 40. | 11958 | | කුළු ගෙඩි 01 | |
| 41. | අංක රහිත | | අලවංගු 01 | |
| 42. | 87073 | | බැටරි 01 | |
| 43. | 12470 | | බැටරි 01 | |
| 44. | 12352 | | බැටරි 01 | |
| 45. | 12355 | | බැටරි 01 | |
| 46. | 12350 | | බැටරි 01 | |
| 47. | 67486 | | බැටරි 01 | |
| 48. | 12353 | | බැටරි 01 | |
| 49. | අංක රහිත | | විදුලි පන්දම | |
| 50. | 81775 01 | | පරණ යකඩ කොටස් අඩංගු උර | |
| 51. | 11334/15 | | අත් කියත් 01 | |
| | | | නියන් 01 | |
| 52. | 38049 01 | | D. V. D. යන්ත්‍රය ජංගම දුරකථන | |
| 53. | 11422 | | වයර් රෝල් | |
| 54. | 62588 | | යකඩ | |
| 55. | 56439 | (i) | වටතුනේ ලිප් 01 | |
| | | (ii) | සිලින්ඩර් 01 | |
| 56. | 98807 | | වටතුනේ ලිප් 01 | |
| 57. | 13112 | | වටතුනේ ලිප් 01 | |
| 58. | 72055 | | වටතුනේ ලිප් 01 | |
| 59. | 35119 | | ගෑස් ලිප් වට 02 | |
| 60. | 14427 | | වටදෙකේ ගෑස් ලිප් 01 | |
| 61. | 35850/18 | | වට 03 ගෑස් ලිප් 1 | |
| 62. | 37721/18 | | වට 03 ලිප් 01, ගෑස් සිලින්ඩර් 01 | |
| 63. | 32055 | | වටතුනේ ගෑස් ලිප් 01 | |
| 64. | 31489 | | වටතුනේ ගෑස් ලිප් 01 | |
| 65. | 33119 | | වටතුනේ ගෑස් ලිප් 01 | |
| 66. | 33125 | (i) | ගෑස් සිලින්ඩර් 01 | |
| | | (ii) | වට දෙකේ ලිප් 01 | |
| 67. | 35427 | | ගෑස් ලිප් 01 | |
| 68. | 35143 | (i) | ගෑස් සිලින්ඩර් 01 | |
| | | (ii) | ගෑස් ලිප් 01 | |
| 69. | 35746 | (i) | ගෑස් ලිප් 01 | |
| | | (ii) | සිලින්ඩර් 01 | |
| 70. | 36801 | | වට හතරේ ගෑස් ලිප් 01 | |
| 71. | 33918 | (i) | ගෑස් සිලින්ඩර් 02 | |
| | | (ii) | ගෑස් ලිප් 02 | |
| | | (iii) | වතුර මෝටර් 01 | |
| | | (iv) | රබර් බට 2 | |
| 72. | 30655 | | ගෑස් සිලින්ඩර් 01 | |
| 73. | 30436 | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 | |
| 74. | 30340 | | වටහතරේ ගෑස් ලිප් 01 | |
| 75. | 27406 | (i) | ගෑස් සිලින්ඩර් 01 | |
| | | (ii) | වටහතරේ ගෑස් ලිප | |
| 76. | 18897 | | වටතුනේ ගෑස් ලිප් 01 | |
| 77. | 17502 | | ගෑස් සිලින්ඩර් 01 | |
| 78. | 19909 | | ගෑස් සිලින්ඩර් 01 | |
| 79. | 30636 | (i) | අංක රහිත | |
| | | | ගෑස් ලිප් 01 | |
| | | | අංක රහිත පැදුරු | |
| 80. | 32040- අංක 144-8900 | | යතුරු පැදිය (අබලි) | |
| 81. | 34142 159-0191 | | යතුරු පැදිය (අබලි) | |
| 82. | 24820 119-2937 | | යතුරු පැදිය (අබලි) | |
| 83. | 1464/13 WPHR -9767 | | යතුරු පැදිය | |
| 84. | 54686 WPMU-5418 | | යතුරු පැදිය | |
| 85. | 92437 SPMG-6727 | | යතුරු පැදිය (අබලි) | |
| 86. | 21069 අංක රහිත | | යතුරු පැදිය (අබලි) | |
| 87. | 21069 අංක රහිත (PR 1243/16) | | යතුරු පැදිය (අබලි) | |
| 88. | 22215 අංක රහිත | | යතුරු පැදිය (අබලි) | |
| 89. | 3746/15 W P W Q 7738 | | යතුරුපැදිය | |
| 90. | 18556 W P J T 3623 | | ලොරි රථය | |
| 91. | 28 ශ්‍රී 0327 | | ලොරි රථය (අබලි) | |
| 92. | 98922 W P S C 5528 | | අත්ට්‍රැක්ටරය | |
| 93. | 20812 W P S F 2174 | | අත්ට්‍රැක්ටරය | |
| 94. | 98440 WPXJ - 9991 | | යතුරු පැදිය | |
| 95. | 19416 44- 8036 | | ට්‍රැක්ටර් ට්‍රේලරය (අබලි) | |
| 96. | 22741 WPGR - 1950 | | ත්‍රිරෝද රථය | |
| 97. | 93436 WPHQ- 7426 | | යතුරු පැදිය | |
| 98. | 90986 WPAAD- 8612 | | ත්‍රිරෝද රථය | |
| 99. | 73850 WPYJ- 0722 | | ත්‍රිරෝද රථය | |
| 100. | 17880 41-2354 | | ලොරි රථය (අබලි) | |
| 101. | 19568 WPQK- 6585 | | ත්‍රිරෝද රථය | |
| 102. | 89716 WPLC- 2107 | | ලොරි රථය | |
| 103. | 22485 WPPV- 6054 | | ඩබල් කැබ් රථය | |
| 104. | 86007 28 ශ්‍රී 4995 | | ලොරි රථය | |
| 105. | 92177 WPLH 0881 | | ලොරි රථය | |
| 106. | AR 1356 | | ආසනය සහිත අඩි 4 1/2 ක් උස ගණදෙවි රූප 01 යි | |

10-76

---

### පොලිස් නිල සුනඛ කොට්ඨාසය - අස්ගිරිය

#### පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 04 දෙනකු 2018.10.13 වැනි දින පැය 09.00 ට මහනුවර, අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම නිල සුනඛයින් එදින උදේ පැය 0800 පරීක්ෂා කර බැලිය හැකි බව දන්වා සිටිමි.

| අනු. අංකය | වර්ගය | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|---|
| 01. | ක්‍රොකර්ස් පැනියල් | - | 01 | 01 |
| 02. | ජර්මන් ෂෙපර්ඩ් | 01 | - | 01 |
| 03. | බෙල්ජියම් මැලිනොයිස් | 01 | - | 01 |
| 04. | දෙමුහුන් | 01 | - | 01 |
| | එකතුව | 03 | 01 | 04 |

එල්. ඒ. සෙනවිරත්න,
පොලිස් අධිකාරි.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය,
මහනුවර.

10-150

---

### මහාධිකරණය - මොණරාගල

#### රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ පවරන ලද දූනට අවසන් වී ඇති නඩු වලට අදාළව රාජසන්තක කරන ලද හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් වෙන්දේසි කිරීමට තීරණය කරන ලද පහත සඳහන් භාණ්ඩ පහත කොන්දේසි වලට යටත්ව, 2018.10.31 වැනි දින පෙ.ව. 9.00 ට මෙම අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(1) මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

(2) අධිකරණය විසින් නියම කරන ලද අඩුම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවක දී හෝ තක්සේරු මිලට ඉල්ලීමක් ඉදිරිපත් නොවන අවස්ථාවක දී ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

(3) වෙන්දේසිය පවත්වන දින ප.ව. 4.00 ට පෙර අදාළ මුදල් ගෙවා භාණ්ඩ අධිකරණ සංකීර්ණයෙන් ඉවත්කර ගත යුතුය. ගෙවීම් සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

(4) වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත් හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

(5) මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන කෙනකු වේ නම් වෙන්දේසි ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කර එකී භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගත යුතුය.

#### වෙන්දේසිය සඳහා නියමිත නඩු භාණ්ඩ

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ සම්බන්ධ විස්තරය |
|---|---|---|
| 01 | මොණ/මහාධි/78/16 (අපරාධ) | WPTP 5366 අංක දරන යතුරු පැදිය |
| 02 | මොණ/මහාධි/66/15 (අපරාධ) | WPHM 3395 අංක දරන යතුරු පැදිය(අමතර කොටස් සඳහා පමණි) |
| 03 | මොණ/මහාධි/52/10 (අපරාධ) | SD 6014 අංක දරන අත්ට්‍රැක්ටරය |
| 04 | මොණ/මහාධි/23/09 (අපරාධ) | 19 - 5153 දරන මෝටර් රථය(අමතර කොටස් සඳහා පමණි) |
| 05 | මොණ/මහාධි/220/08 (අපරාධ) | එවරෙඩි විදුලි පන්දම |
| 06 | මොණ/මහාධි/72/17 (අපරාධ) | බෆල් 01 යි |
| 07 | මොණ/මහාධි/111/17 (අපරාධ) | විදුලි පන්දම් 01යි/ බූට් සපත්තු ජෝඩු 01 යි |
| 08 | මොණ/මහාධි/70/17 (අපරාධ) | මේස පිහිය |

#### 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් වෙන්දේසි කිරීමට යෝජිත භාණ්ඩ

| | | |
|---|---|---|
| 09 | ඇඳි පුටු | 02 යි |
| 10 | සාමාන්‍ය පුටු | 03 යි |
| 11 | පා පැදි | 01 යි |

ප්‍රදීප් එම්. අබේරත්න,
මහාධිකරණ විනිසුරු,
ඌව පළාත්බද මහාධිකරණය,
මොණරාගල.

2018 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඌව පළාත්බද මොණරාගල මහාධිකරණයේ දී ය.

10 - 44

---

## රජයේ නොවන දැන්වීම්

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| සමාගමේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ කාර්යාලය |
|---|---|---|
| අල්ලුරේ ප්‍රොපර්ටීස් (පීවීටී) එල්ටීඩී | පී වී 00202581 | අංක 134, එස්. ඩී. එස්. ජයසිංහ මාවත, නුගේගොඩ |
| ජොයිස්ප්‍රී ලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 00202926 | අංක 4, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 04 |
| අන්කොමන් හෝම්ස් ඩිසයින් ස්ටූඩියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 00203398 | අංක 137, නාවල පාර, නුගේගොඩ |
| විල්මාර් ටී ලංකා (පීවීටී) එල්ටීඩී | පී වී 00203570 | අංක 4, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 04. |

සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

10-69

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ටෝටල් ට්‍රිම්ස් ඇන්ඩ් පැකේජින් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 120311
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 74, කටුවාවල පාර, මහරගම
ලියාපදිංචි දිනය : 2017.02.23

සමාගමේ නම : මයින්ඩ්ෆෝ කෝපරේෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00203307
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 95, සුනේත්‍රාදේවි පාර, කොහුවල
ලියාපදිංචි දිනය : 2018.08.21

සමාගමේ නම : ඉන්සයිඩ් හෝම් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00200727
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 420/29, වැලිපාර, තලවතුගොඩ
ලියාපදිංචි දිනය : 2018.06.02

සමාගමේ නම : නිව් ආයු හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202373
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : ඩඩ්ලි සේනානායක මාවත, අඹේපුස්ස, වරකාපොල
ලියාපදිංචි දිනය : 2018.07.24

(ඉහත සඳහන් සමාගම් ලේකම්වරු)

10-22

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : අර්යානා හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00203067
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 1082/11, ආටිගල මාවත, රාජගිරිය
ලියාපදිංචි දිනය : 2018.08.13

සමාගමේ නම : ඩී එච් එස් ග්‍රීන් වින් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202136
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 162/24, නව නුවර පාර, පිට්ටුගල, මාළඹේ
ලියාපදිංචි දිනය : 2018.07.17
සමාගමේ නම : ෆිට්කෙයාර් සිංගපූර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202982
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 463/4, ලේක් පාර, තලංගම දකුණ
ලියාපදිංචි දිනය : 2018.08.10

සමාගමේ නම : ආර් එස් ඔටෝ සොලූෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00203205
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 117, මයිල් පොස්ට්, නොච්චිමොටයි, වව්නියාව
ලියාපදිංචි දිනය : 2018.08.19

සමාගමේ නම : ටැක්ට් බිස්නස් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00203208
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 482/1, අග්ගොන, අංගොඩ
ලියාපදිංචි දිනය : 2018.08.19

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී
(සමාගම් ලේකම්වරු)

10-24

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : විශාකා මෝටර් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 125911
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 336/3, 6 වන වීදිය, ඉසුරුපුර මාවත, කැස්බෑව, පිළියන්දල
ලියාපදිංචි දිනය : 2017.09.27

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

10-25

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගම් නාමය : රන්බිම හෝල්ඩිංස් ලංකා (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පී වී 129625
සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 337, වැලිපැන්න පාර, සීනිවත්ත, අළුත්ගම
ලියාපදිංචි කළ දිනය : 2018.02.07

සමාගමේ ලේකම්.

10-28

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පන්නිපිටිය, සමගි මාවත, අංක 334 හි පදිංචි රණතුංග ආරච්චිලාගේ චතුර රොෂාන් පෙරේරා වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නපුර, මාරපන, ගල්ලින්න පාර, රජනෑව රිසෝට් හි පදිංචි රණතුංග ආරච්චිලාගේ රෝහිත ප්‍රේමලාල් පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංක 632100302 වී) යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් ප්‍රදානය කරන ලද රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් සනත් අබේරත්න විසින් වර්ෂ 2013 නොවැම්බර් මස 05 වැනි දින ලියා සහතික කරන ලද අංක 7005 දරන ඇටර්නි බලපත්‍රයේ සඳහන් උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති ඉඩමෙහි සංචාරක හෝටල් ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම, එකී දේපළ වැඩි දියුණු කිරීම, විකිණීම, උකස් කිරීම සහ/හෝ බද්දට දීම සහ/හෝ එකී දේපළ සම්බන්ධ සියලු බැංකු සහ මූල්‍ය කටයුතු සිදු කිරීම ඇතුළු සියලු බලතල සඳහා ක්‍රියා කිරීමට බලය ලබා දුන් අතර එකී ඇටර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබ ඇති බවත් ඊට බලයක් හෝ ප්‍රතිඵලයක් නොතිබෙන බවටත් එකී රණතුංග ආරච්චිලාගේ රෝහිත ප්‍රේමලාල් පෙරේරා යන අය විසින් එකී දේපළ සම්බන්ධයෙන් සංචාරක හෝටල් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම, එකී දේපල වැඩි දියුණු කිරීම, විකිණීම, උකස් කිරීම සහ/හෝ බද්දට දීම සහ/හෝ එකී දේපළ සම්බන්ධ සියලු බැංකු සහ මූල්‍ය කටයුතු සිදු කිරීම ඇතුළු සියලු බලතල සම්බන්ධයෙන් කරන හෝ කිරීමට අදහස් කරනු ලබන මොන යම් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් මෙයින් මතු නීතිමය වශයෙන් වගකීමට මා බැඳී නොසිටින බවටත් එකී රණතුංග ආරච්චිලාගේ රෝහිත ප්‍රේමලාල් පෙරේරා යන අයට එකී දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට කිසිදු බලයක් නොමැති බවටත් රණතුංග ආරච්චිලාගේ චතුර රොෂාන් පෙරේරා වන මා විසින් ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් නිවේදනය කර දැනුම් දී සිටිමි.

ආර්. ඒ. සී. ආර්. පෙරේරා.

10-31

---

### ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

මුරුතවෙල, පස්යාල, අංක 7/1 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 626322543 වී හිමි බේරුවලගේ පුෂ්පා රංජනී යන අය ඇටර්නි බලකරු ලෙස පත් කරමින්, වර්ෂ 2016.11.27 වැනි දින පී. කේ. ඉරේෂිකා ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද අංක 523 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කළ බවත් එකී විශේෂ ඇටර්නි බලපත්‍රය ශූන්‍ය හා බලරහිත, නීතිය ඉදිරියේ බලාත්මක කළ නොහැකි ලේඛනයක් බවත් මුරුතවෙල, පස්යාල, අංක 7/1 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 658580574 වී හිමි බේරුවලගේ නාලිකා ප්‍රියංගනී වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

බේරුවලගේ නාලිකා ප්‍රියංගනී.

10-33

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

පන්නිපිටිය, නැ/ඇරැව්වල, මෛත්‍රී මාවතේ, අංක 260/2 පදිංචි පන්ඩිතවිදාන සනත් ප්‍රසාද් ගුණවර්ධන වන මා විසින් වර්ෂ 2006 පෙබරවාරි මස 14 වැනි දින පන්නිපිටිය නැ/ඇරැව්වල, මෛත්‍රී මාවතේ, අංක 260/2, පදිංචි ලියනපටබැඳිගේ අෂලා මංගලිකා ගුණවර්ධන යන අය වෙත ලබා දෙන ලද අංක 123 ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවට සියලු මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. තවද, මෙතැන් පටන් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් ඉහත කී ලියනපටබැඳිගේ අෂලා මංගලිකා ගුණවර්ධන යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ අත්සන් කරනු ලබන කිසිදු ඔප්පුවකට මා විසින් වගකියනු නොලබන බවත් තවදුරටත් දැනුම් දෙනු ලැබේ. මෙම බලපත්‍රය 2018.09.17 වැනි දින සිට අවලංගු වෙයි.

පන්ඩිතවිදාන සනත් ප්‍රසාද් ගුණවර්ධන.

10-35

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සීමිත වගකීම් සමාගමක් ලෙස 2016 ජූනි මස 08 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : කලර් මැක්ස් ප්‍රින්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 114227
ලියාපදිංචි ලිපිනය : අංක 436/6, කොට්ටාව පාර, වල්ගම, අතුරුගිරිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. එස්. එස්. ඇසොසියේට්ස්
දුරකතන අංක : 077 2340581/077 3362880/ 081 2351985

10-43

---

### ඇටෝර්නි බලයක් අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම නිවේදනය

මුදුන්ගොඩ, කතුරුවත්ත අංක 74/3 හි පදිංචි තල්පේගේ කුසුමාවතී පෙරේරා විසින් මුදුන්ගොඩ ගොඩගෙදර අංක 74/3 හි පදිංචි නිලංග කසුන් වන්නිආරච්චි වෙත පිරිනමන ලද 2008 වොෂිංටන් ඩී. සී. එන්. ඩබ්ලිව්. වයෝමිං ඇවනිව් හි අංක 2148 පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය කේ. ඩී. රංජිත් විසින් 2013 ඔක්තෝබර් මස 01 වැනි දින ලියා සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලය 2018 අගෝස්තු මස 20 වැනි දින සිට වලංගු වන පරිදි අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවට මෙයින් නිවේදනය කෙරේ.

10-50

---

### නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එස් ආර් ටී එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 48, 27 වැනි පටුමග, කොළඹ 03
සංස්ථාගත කළ දිනය : 2018 සැප්තැම්බර් 7
ලියාපදිංචි අංකය : පී වී 00203913

අධ්‍යක්ෂ.

10-58

---

### සමාගමේ තත්ත්වය වෙනස්වීම හේතුවෙන් නම වෙනස් කිරීම පිළිබඳ පොදු දැන්වීම

යුනයිටඩ් බී පී ඕ කම්පැනි ලිමිටඩ් - පී බී 1435

2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (5) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව යුනයිටඩ් බී පී ඕ කම්පැනි ලිමිටඩ් සමාගම විසින් සිය සමාගමේ තත්ත්වය වෙනස් කිරීම සඳහා 2018 අගෝස්තු මස 30 වැනි දින සම්මත කරන ලද කොටස් හිමියන්ගේ විශේෂ යෝජනා සම්මතය අනුව එකී සමාගමේ නාමය ''යුනයිටඩ් බී පී ඕ කම්පැණි ලිමිටඩ්'' සිට ''යුනයිටඩ් බී පී ඕ (ප්‍රයිවට්) ලිමිටඩ්'' ලෙස වෙනස් කරනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඇසන්ට් සෙක්‍රටේරියල් කන්සල්ටන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරු.

10-71

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොට්ටාව, හොරණ පාර, අංක 171 සහ Via Turcino. No. 20 (H) Milano Italy දරන ස්ථානයේ පදිංචි මුරමුදලිගේ මල්ලිකා චන්ද්‍රලතා බියට්‍රිස් (ජා. හැ. ප. අංක 456902081 V) වන මා විසින් අම්බලන්ගොඩ, නම්බිමුල්ල පාර, අංක 19 දරන ස්ථානයේ පදිංචි අරුණ ලසන්ත හේවගේ නැතහොත් අරුණ ලසන්ත හේවාගේ (ජා. හැ. ප. අංක 196515001571) වෙත බලය පවරමින් අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ජී. මධුර චින්තක මහතා විසින් සහතික කරන ලද අංක 574 සහ 2018.06.01 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2018.09.14 වැනි දින පටන් බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බවද, එකී ඇටෝර්නි බලපත්‍රය අද දින සිට කිසිදු නෛතික බලයක් හෝ ප්‍රතිඵලයක් නැති ශූන්‍ය ලියවිල්ලක් බව ද, ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ. එබැවින් 2018.09.14 වැනි දිනට පසුව ඉහත කී මුරමුදලිගේ මල්ලිකා චන්ද්‍රලතා බියට්‍රිස් වන මා විසින් හෝ මා වෙනුවෙන් හෝ මාගේ අවසරය පිට යැයි සඳහන් කරමින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වගකීමක් නොමැති බව ද විශේෂයෙන් දන්වා සිටිමි.

තවද, මෙම දිනයේ සිට එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ලියවිල්ලක්, ඔප්පුවක් හෝ වෙනත් ලේඛනයක් සම්බන්ධයෙන් මා විසින් වගකීමක් නොබැඳෙනු ලබන බවත්, එවැනි ලේඛනයක කිසිදු නිත්‍යානුකූලභාවයක් නොමැති වන බවටත්, ශ්‍රී ලංකා රජයට සහ සියලුම මහජනතාව වෙත තවදුරටත් දන්වා සිටිමි.

මුරමුදලිගේ මල්ලිකා චන්ද්‍රලතා බියට්‍රිස්.

2018 සැප්තැම්බර් 14 වැනි දින.

09-74

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : භූමි රියල්ටි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 200984
ලියාපදිංචි කාර්යාලය : අංක 75, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08
සංස්ථාපනය කළ දිනය : 2018 ජූනි 14 වැනි දින

සමාගම වෙනුවෙන්,

පෙලේ කන්සල්ටිං (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

10-79

---

### ස්පීඩ් ඉටැලියා (ප්‍රයිවට්) ලිමිටඩ් ණය හිමියන් මගින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම (පිවී 75378)

මෙමගින් දැනුම් දෙන පරිදි ස්පීඩ් ඉටැලියා (ප්‍රයිවට්) ලිමිටඩ් ණය හිමියන්ගේ සහ සාමාජිකයන්ගේ රැස්වීමක් 2018 සැප්තැම්බර් මස 07 වැනි දින පෙරවරු 10.00 ට සහ 10.30 ට 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ දී පවත්වන ලද අතර එහි දී පහත සඳහන් යෝජනාවන් සම්මත කර ගන්නා ලදී.

ස්පීඩ් ඉටැලියා (ප්‍රයිවට්) ලිමිටඩ් ණය හිමියන් මගින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය ගන්නා ලදී.

එකී රැස්වීමේ දී ණය හිමියන් සහ සාමාජිකයන් විසින් සම්මත කර ගන්නා ලද පරිදි අංක 03 ඊ, කිංසි පාර, කොළඹ 08 ලිපිනයෙහි පදිංචි කහඳවල ආරච්චිගේ කිත්සිරි පෙරේරා ගුණවර්ධන මහතා එම වසා දැමීම සඳහා ඈවරකරු ලෙස පත් කරන ලද අතර, අදාළ වසා දැමීම සඳහා සාමාන්‍ය ප්‍රමාණාත්මක ගාස්තු ඔහු විසින් අය කරනු ඇත.

ඈවරකරුට මෙහි දී 2007 අංක 7 දරන සමාගම් පනතේ සියලුම හෝ ඕනෑම බලතලයක් පාවිච්චි කිරීම සඳහා මෙමගින් බලය පවරන ලදී.

මේ හේතුවෙන් අධ්‍යක්ෂකවරුන් සතු සියලු බලතල අවසන් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ස්පීඩ් ඉටැලියා (ප්‍රයිවට්) ලිමිටඩ්.
සමාගම් ලේකම්වරු.

2018 සැප්තැම්බර් 12.

10-80/1

---

### ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිළියන්දල මාම්පේ, පී. එස්. පෙරේරා මාවත, ''අජන්ත'' අංක 111 සී හි පදිංචි දෙන් ලෙස්ලි ලීලාරත්න හඳුන්ගේ (ජාතික හැඳුනුම්පත් අංක 531880412 V) වන මා විසින් පිළියන්දල, මාම්පේ පී. එස්. පෙරේරා මාවත, ''අජන්ත'' අංක 111 සී හා පදිංචි දෝන ශ්‍රියා හඳුන්ගේ රත්නායක යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රංශසා අලවත්ත මහත්මිය විසින් වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 02 වැනි දින සහතික කරන ලද අංක 87 දරන ඇටර්නි බලය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව චශ්‍රී ලංකා ජනරජයටත් සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට දෙන් ශ්‍රියා හඳුන්ගේ රත්නායක යන අය මා නමින් සිදු කරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් මා වග නොකියන බව මෙයින් දන්වා සිටිමි.

ඩී. එල්. එල්. හඳුන්ගේ.

10-639

---

### ස්පීඩ් ඉටැලියා (ප්‍රයිවට්) ලිමිටඩ් - (පිවී 75378)

ණය හිමියන් මගින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) දරන අනු වගන්තිය

මෙමගින් දැනුම් දෙන පරිදි අංක 03 ඊ, කිංසි පාර, කොළඹ 08 ලිපිනයෙහි පදිංචි කහඳවල ආරච්චිගේ කිත්සිරි පෙරේරා ගුණවර්ධන වන මම ස්පීඩ් ඉටැලියා (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඈවරකරු ලෙස එහි ණය හිමියන් 2018 සැප්තැම්බර් මස 07 වැනි දින 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ පවත්වන ලද රැස්වීමේ දී පත් කරන ලදී.

කේ ඒ කේ පී ගුණවර්ධන,
ඈවරකරු.

අංක 03 ඊ, කිංසි පාර,
කොළඹ 08.
2018 සැප්තැම්බර් මස 10 වැනි දින.

10-80/2

---

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ සමාගම පහත පරිදි සංස්ථාගත කිරීම මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : ලාබ කඩේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00203944
දිනය : 2018.09.08
ලියාපදිංචි ලිපිනය : අංක 72, කෙලින් වීදිය, අකුරැස්ස

අධ්‍යක්ෂකවරුන්ගේ ඉල්ලීම පරිදි,

සෙනරත් පරණ යාපගේ මදුෂි,
ලේකම්.

10-82

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බණ්ඩාරගම, ගොවි ජනපදය රේරුකාන අංක 393 ඒ හි පදිංචි කපුරුපක්ෂ පල්ලවලාගේ අමරාවතී (ජා. හැ. අංක 678121550 V) වන ඇටර්නි බලපත්‍රලාභී වන මට පොල්ගස්ඕවිට උන්දුරුගොඩ 44 වර්තමානයේ වියා ඩී පියෙට්රලාටා 161 රෝමය හි පදිංචි කපුරු පක්ෂ පල්ලවලාගේ රුවන් ජයසිරි (ගුවන්ගමන් බලපත්‍ර අංක එන් 1751327) යන අය විසින් 2013 මාර්තු 06 වැනි දින ඕ කේ ඒ එස් ඕබඩගේ ඇටෑච් සාම විනිසුරු රෝමයේ ශ්‍රී ලංකා තානාපති මගින් සහතික කර මා වෙත ප්‍රදානය කරන ලද ඇටර්නි බලපත්‍රය අවලංගු කළ බව මෙයින් දන්වා සිටිමි.

10-86

---

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය යටතේ සමාගම පහත පරිදි ව්‍යාපාර නාමය වෙනස් කිරීම මෙයින් දන්වා සිටිමු.

සමාගමේ පෙර නම : සිරිල් ප්‍රනාන්දු ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නම : ජේ සී එෆ් ආර්කිටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102398
දිනය : 2018.03.19
ලියාපදිංචි ලිපිනය : අංක 05 ඒ, සම්නර් පෙදෙස, කොළඹ 08

10-94/1

සමාගමේ නම : විදුහස පවර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 130818
සංස්ථාගත කළ දිනය : 2018.03.16
ලියාපදිංචි ලිපිනය : අංක 388/2 බී, වැව පාර, අදියර 01, අනුරාධපුරය

සමාගමේ නම : ෆොටෝලින්ක් ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 131423
සංස්ථාගත කළ දිනය : 2018.04.16
ලියාපදිංචි ලිපිනය : අංක 349, කෝට්ටේ පාර, නුගේගොඩ.

සමාගමේ නම : ප්‍රියන්ත ජෙම්ස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 131712
සංස්ථාගත කළ දිනය : 2018.04.12
ලියාපදිංචි ලිපිනය : අංක 15/1, චාල්ස් වේ. කොළඹ 03.

ගෙස්ට්මෙන් කෝපරේට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

10-208

---

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

